# "සැපයුම් කළමනාකරුවන්ගේ සහතිකපත්‍ර" එක් අවුරුදු පාඨමාලාව

## <u>සිංහල මාධ්‍යය</u>

# "SUPPLY MANAGERS' CERTIFICATE" ONE YEAR COURSE

අප ආයතනය මගින් සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලබන මූලික හා කළමනාකරණ පාඨමාලා වලට පසුගාමීව ඉහල මට්ටමේ පාඨමාලාවක් ලෙස මෙය සංවිධානය කොට ඇති අතර සැපයුම්දාම කළමනාකරණයට ඇතුලත් වන මිලදීගැනීම්, ගබඩාකරණ හා තොග පාලන යන ක්ෂේත්‍රයන්ගේ කාර්යභාරය හා වැදගත්කම පිළිබඳව පුළුල් දැනුමක් ලබාදීමත් - සැපයුම්දාම කළමනාකරණ කටයුතු කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය සඳහා මෙම පාඨමාලාව සැලසුම් කොට ඇත.

පාඨමාලාව පිළිබඳව විස්තර :-

| | | |
|---|---|---|
| කා සඳහාද | - | සැපයුම් හා ගබඩා කටයුතු වල යෙදී සිටින ලිපිකරුවන්, සුපරික්ෂක හා කණිෂ්ඨ විධායක ශ්‍රේණිවල රැකියා නියුක්තිකයන් සඳහා. |
| සුදුසුකම් | - | අ. පො. ස. (උ. පෙළ.) සමත්වීම හෝ අ. පො. ස. (සා. පෙළ.) සමත් වීම මිලදීගැනීම් හා ගබඩා හා තොග පාලන කේෂ්ත්‍රයේ රැකියාවල පළපුරුද්ද හෝ අප ආයතනයේ ගබඩාකරණය – මිලදීගැනීම් ප්‍රතිපත්ති හා පිරිවැය ගබඩා මිළදීගැනීම් කළමනාකරණය යන පාඨමාලා වලින් එකක් සමත්වීම. |
| කාලසීමාව | - | එක් වසරක් උදේ 9.00 – 4.15 (සෙනසුරාදා දින පමණක්) |

පාඨමාලා අන්තර්ගතය (මොඩියුල්) -

1. සැපයුම් දාම කළමනාකරණය හා මිලදී ගැනීමේ මූලධර්ම
2. කළමනාකරණ මූලධර්ම හා විවිධ කළමනාකරණ ක්‍රියාවලින්
3. මිළදී ගැනීම් කළමනාකරණය
4. ගිවිසුම් කළමනාකරණය හා සැපයුම් ද්‍රව්‍ය කළමනාකරණයට අදාල නෛතික කටයුතු
5. නාවික හා නිශ්කාෂණ කටයුතු
6. ගබඩා හා ගබඩාංගන කළමනාකරණය
7. මූල්‍ය කළමනාකරණය
8. තොග පාලනය
9. සැපයුම් දාම කළමනාකරණයට අදාල පරිඝනක ක්‍රියාවලිය හා ව්‍යපාර සංනිවේදනය
10. සංඛ්‍යානය

මෙම පාඨමාලාවට අදාල මොඩියුල පිළිබඳව පරික්ෂණ පැවැත්වීම මේ අයුරින් සිදුවේ. එක් මොඩියුලයක් අවසානයේදී පැවැත්වෙන මෙම පරික්ෂණය කොටස් 2කින් යුක්තය. ලිඛිත

පැවරුමක් සහ එය වාචිකව ඉදිරිපත් කිරීම මින් පළමු කොටසට අයත් වන අතර පැය 3ක ලිඛිත පරීක්ෂණය දෙවන කොටසට අයත්වේ. සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 30% ක් ලිඛිත පැවරුමට සහ වාචික ඉදිරිපත් කිරීමට හිමිවන අතර 70% ක් වූ ඉතිරි ලකුණු ප්‍රමාණය පැය 3 ක ලිඛිත පරීක්ෂණයට ලැබෙනු ඇත.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව - රු. 25,000/- (ආපසු නොගෙවන පදනම මත)

පාඨමාලා ගාස්තුව - රු. 65,000/-

ගෙවීමේ ක්‍රමවේදය - චෙක්පතකින් ගාස්තු ගෙවන්නේ නම් එය <u>“සැපයුම් හා ද්‍රව්‍ය කළමාකරණ ආයතනය”</u> නමින් අදායකයාගේ ගිණුමට පමණයි යනුවෙන් රේඛනය කර තිබිය යුතු අතර මුදලින් ගෙවීම් කරනු ලබන්නේ නම් වෙළඳ නිවාඩු හැර සතියේ ඕනෑම දිනක පෙ.ව. 9.00 සිට ප.ව. 4.30 දක්වා කල හැකිය. එසේත් නැතිනම් තැපැල් මාර්ගයෙන් එවන්නේ නම් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එසෙත් නැති නම් අදාල මුදල කොළඹ 07. ලංකා බැංකු නිදහස් චතුරශ්‍ර ශාඛාවේ අපගේ ගිණුම් අංක 74668943 දරණ ගිණුමට ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් බැර කල හැකිය.. එසේ කරන්නේ නම් බැංකු ලදුපත සමග ඔබගේ නම සහ පාඨමාලාවේ නම පැහැදිලිව සඳහන් කොට ෆැක්ස් අංක 01125302 අංකයට ලැබීමට සැලැස්විය යුතුය.

අනුග්‍රාහකයින් මගින් අයදුම් කරන අයදුම්කරුවන් ලියාපදිංචි වීම සඳහා අනුග්‍රාහකයාගෙන් ගෙවීම් පිළබඳ සහතික කොට ලිපියක් අපවෙත ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

අයදුම්පත නිසි පරිදි පුරවා ඳල කාර්යාලය වෙත භාරදිය යුතු අතර වැඩිපුර අයදුම්පත් අවශ්‍ය වේ නම් ඡායා පිටපතු භාවිතා කල හැකිය.

මේ සම්බන්ධව තවදුරටත් විස්තර අවශ්‍ය වේ නම් දුරකථන අංක 2584302 හෝ 2555562 ඇමතීමෙන් ලබාගත හැකිය.

විමසීම් : පී. එන්. ලියනගේ මිය
පාඨමාලා නිළධාරිණී
දුරකථන/ෆැකස් අංක - 011 2584302 (කාර්යාලය)
විද්‍යුත් තැපෑල - pushpaismm@gmail.com